# ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය මුහුණපාන ගැටලු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ආර්. එන්. කේ. රාජපක්ෂ**[1]


## සංක්ෂේපය

1970 ට පෙර කාලයේ, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂි අපනයන භෝග කෙරෙහි දැඩි රැඳියාවක් දැක්වූ තත්වයටම, රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය කෙරෙහිද දැඩි රැඳියාවක් දැක්වීමට සිදු වී ඇත. එසේම වර්තමාන ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට, අපනයන ඉපැයුම්වලට සහ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් සපයමින් ආර්ථිකයේ වැදගත් අංගයක් බවට පත් වී ඇත. 2002 වර්ෂයට සාපේක්ෂව ලංකවේ දල දේශීය නිෂ්පාදිතයට රෙදිපිළි හා ඇගලුම් නිෂ්පාදන අංශයෙන් 17% ක් පමණ දායක වන අතර මුළු අපනයන ඉපැයුම්වලින් 52% ක් පමණ ද, මුළු කාර්මික අපනයන ඉපැයුම්වලින් 70% ක් පමණ ප්‍රමාණයක් ද, රෙදිපිළි හා ඇගලුම් අපනයනයන්ගෙන් සමන්විත වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගලුම් කර්මාන්තය වර්තමානයේ දී මුහුණ දෙනු ලබන ගැටලු සහ උපනතීන් පිළිබඳව විමසා බැලීමයි. මේ සඳහා දත්ත ලබා ගැනීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස ද්විතීක දත්ත භාවිතා කරන ලදී. එහිදී 2002 වර්ෂයට අදාළ වාර්ෂික මහ බැංකු වාර්තාව උපයෝගී කරගන්නා ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී, මෙම කර්මාන්තය මුහුණපාන ප්‍රධානතම ගැටලුව ලෙස හඳුනා ගනු ලැබුවේ, මෙම අංශය තුළ වැඩි වශයෙන් ආනයනික අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර භාවිතා කිරීමයි. එබැවින් මෙම අංශයේ ශුද්ධ විදේශීය විනිමය ඉපැයුම් අඩු මට්ටමක පවතී. ආනයනික අමුද්‍රව්‍ය මිල ගණන් වැඩිවන විට මෙම අංශයේ නිෂ්පාදන පිරිවැය ද ඉහළ යයි. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා දේශීය අමුද්‍රව්‍ය භාවිතය වැඩි කිරීමත් නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීමත් ක්‍රමවත් කළමනාකරණය තුළින් ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීමත් ආදී ක්‍රියාමාර්ග ගත හැකිය. මෙම ගැටලු මගහරවා ගනිමින් අනාගතයේ දී ලංකාවේ රෙදිපිළි හා ඇගලුම් කර්මාන්තයේ වර්ධනය තුළින් ධනවාදී සංවර්ධනයක් ලබාගත හැකි අතර එසේ නොවුනහොත් ලංකා ආර්ථිකයේ බිඳ වැටීමක් සිදුවිය හැකි බව නිගමනය කළ හැක.


**මුඛ්‍ය පද ඃ** රෙදිපිළි, ඇගලුම් කර්මාන්තය, ගැටලු, නිෂ්පාදන, අමුද්‍රව්‍ය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kawmadirajapaksha@gmail.com